# ද්‍රව්‍යවාදීන්ගේ මොළය පිළිබඳ ප්‍රශ්නයක්

සිත නිර්මාණයෙහි යෙදෙන බව ද පැන යන්න වුව ද සිතෙහි නිර්මාණයක් බව ද අපි කීවෙමු. යමක් අප ඉදිරියේ ඇතැයි යනුවෙන් සම්මුති වශයෙන් අපට පැවසිය හැකි වුව ද, අප කරන්නේ ඇස නමැති ඉන්ද්‍රියෙහි ද ආධාරය ඇතිව මනසින් යමක් නිර්මාණයකිරීම ය. පැන ද නිර්මාණයක් වන්නේ එලෙසින් ය. අපට සවිඥානික විය හැක්කේ සවිඥානික සිත ගැන පමණ ය. එසේ නම් අවිඥානික සිත් ඇති බව අප දැනගත්තේ කෙසේ ද? අවිඥානික සිත ද සවිඥානික සිතෙහි නිර්මාණයක් වේය යන්න පමණක් නොව මනස, මනසෙහි නිර්මාණයක් වේය යන මතය ද අපි දරන්නෙමු.

අවිඥානික සිත අපට සවිඥානික නො වෙයි. එහෙත් අපට ඇතැම් කරුණු සඳහා, නැතහොත් යම් යම් දේ තේරුම්ගැනීම සඳහා විවිධ සංකල්ප නිර්මාණයකිරීමට අපට සිදුවෙයි. ඒ නිව්ටන් පඬිවරයා ගුරුත්වාකර්ෂණ සංකල්පය නිර්මාණය කළ ආකාරයට ය. නිව්ටන් විද්වතා ගුරුත්වාකර්ෂණය නිර්මාණය කෙළේ පොල්, ඇපල් ආදිය පොළොවට වැටෙන්නේ ඇයි ද යන්න තේරුම්කර දීමට ය. ගුරුත්වාකර්ෂණය ගැන අපට සවිඥානික විය හැක්කේ සංකල්පයක් ලෙස පමණ ය. ගුරුත්වාකර්ෂණය යටතේ වැටෙන්නේ යැයි කියන අවස්ථාවක දී වුව ද ඒ ගැන අපට හැඟීමක් හෝ දැනීමක් හෝ නැත. අප දන්නේ අප වැටෙන බව පමණකි.

අවිඥානික සිත යන්න ද එවැනි නිර්මාණයකි. එය සවිඥානික සිතෙන් නිර්මාණය කෙරෙන්නකි. එලෙස අවිඥානික සිතක් නිර්මාණයකෙරෙන්නේ ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරු ලෙස ය. අපට අතැම් දෑ සිතෙන්නේ කෙසේ ද? අප සිහින දකින්නේ කෙසේ ද? අප නොසිතාම ඇතැම් දෑ කරන්නේ යැයි කීම තේරුම්ගන්නේ කෙසේ ද? මේ ආදී ප්‍රශ්න රාශියකට පිළිතුරු අවිඥානික සිත ඔස්සේ අපට ලබාගත හැකි ය. ගුරුත්වාකර්ෂණය මෙන් ම අවිඥානික සිත ද මිනිසුන්ගේ සවිඥානික සිත්වල නිර්මාණයකි. ගුරුත්වාකර්ෂණය යටතේ වැටෙන වෙලාවක දී වුව ද, ගුරුත්වාකර්ෂණය අපට නොදැනෙයි. එමෙන් ම අවිඥානික සිත ද අපට නො දැනෙයි.

මෙහි දී අවධාරණයකළ යුතු කරුණක් නම් පැන යන්න ද අපට දැනෙන්නේ සවිඥානික සිත ඔස්සේ බව ය. පැන, පැනක් ලෙස ගන්නේ සවිඥානික සිතෙන් ය. එහි දී ඇස හෝ වෙනත් ඉන්ද්‍රියක් ද ආධාරවන බව සැබෑ ය. එහෙත් සිතක්, මනසක් නොවන්නට අපට පැනක් ගැන දැනගැනීමට, එනම් පැන යන්න නිර්මාණයකිරීමට නො හැකි ය. පැන ආදී මේ සියල්ල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනවබෝධයෙන් අප විසින් සංස්කරණය කෙරෙන දෑ පමණකි.

දැන් ප්‍රශ්නය වනුයේ සවිඥානික සිත ද නිර්මාණයක් නොවන්නේ ද යන්න ය. එමෙන්ම අවිඥානිකව අප යම් යම් දෑ නිර්මාණය නොකරන්නේ ද යන්න ය. සවිඥානික සිත ද නිර්මාණයකි. එය මනසේ නිර්මාණයක් වෙයි. මනස ද මනසෙහි නිර්මාණයකි. මනස මනසෙහි නිර්මාණයක් වන්නේ කෙසේ ද යන්න ඉරිදා දිවයින පුවත්පතෙහි පළවූ සිංහල බෞද්ධ මනස යන ලිපියෙහි විස්තර කෙරී ඇත.

අවිඥානික මනසෙන් ද යම් යම් දෑ නිර්මාණයකරනු ලැබෙයි. ඒ ඇතැම් දෑ සවිඥානික මනසට සන්නිවේදනය වෙයි. එලෙස සන්නිවේදනයවන්නේ කෙලෙසද යන ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් නිර්මාණයකරගැනීමට අපට තවමත් නොහැකි වී ඇත. අප අවිඥානිකව නිර්මාණය කරන, නිවැරදිව කිවහොත් අවිඥානිකව නිර්මාණය කෙරෙන, බොහෝ දෑ පිළිබඳ ව අප සවිඥානික නොවන්නේ යැයි සිතිය හැකි ය. එයට හේතුව එසේ අවිඥානිකව නිර්මාණයකෙරෙන බොහෝ දෑ සවිඥානික මනසට සන්නිවේදනය නො වීමයැයි ද ඒ සමග ම සිතිය හැකි ය.

සිතෙහි උඩු සිත හා යටි සිත යනුවෙන් කොටස් දෙකක් ගනු වෙනුවට ඇත්තේ එකම කොටසක් පමණක් යැයි ගත හැකි ද? එසේ ගැනීම ද නිර්මාණයක් බව පළමුවෙන් ම කිවයුතු ය. ඇත්තේ එකම සිතක් ලෙසත් ඒ සිත සවිඥානික අවස්ථාවන්හි දී උඩු සිත ලෙසත් අවිඥානික අවස්ථාවන්හි දී යටි සිත ලෙසත් ගැනීමට බැරිකමක් නැත. එය ද සිත ගැන තැනිය හැකි ආකෘතියක් වෙයි. නැත්නම් සිතෙහි නිර්මාණයක් වෙයි. අවශ්‍යවන්නේ මේ ඕනෑම නිර්මාණයක් සංගත ව කිරීම පමණකි.

© Prof. Nalin De Silva

මනස යනුවෙන් යමක් පවතින්නේ ද යන ප්‍රශ්නය ඇතැම් ද්‍රව්‍යවාදීහු නගති. මේ ද්‍රව්‍යවාදීන්ට අනුව මනස යනුවෙන් දෙයක් නැත. ඇත්තේ මොළයේ ක්‍රියාකාරකම් පමණකි. ඔවුන්ට අනුව මොළය කියා දෙයක් ඇති බව පැහැදිලි ය. එහෙත් ලංකාවේ ජීවත්වන ද්‍රව්‍යවාදීන් නම් මේ සියල්ල ගැන මෙලෙස කතාකරන්නේ ඔවුන්ගේ මොළයෙන් කල්පනාකළ දෙයක් නොව බටහිරයන්ගේ මොළවලින් කල්පනාකර සෙසු ලෝකයාට පටවන ලද දේ ය. දාර්ශනික ගුරුකුලයක් වූ විඥානවාදයෙහි මෙන් නොව මනස ද නිර්මාණයක් බව අපි ද කියමු. එහෙත් අප කියාසිටින්නේ මනස පමණක් නොව ද්‍රව්‍ය ලෙස අප විසින් ගනු ලබන දේ ද අපේ මනසේ නිර්මාණ බව ය. ඒ ඒ දෑ පවතින්නේ සම්මුති වශයෙන් පමණක් යැයි අපි කියමු. මොළය යන්න ද මනසෙහි නිර්මාණයක් වෙයි. සිංහල බෞද්ධයෝ විඥානවාදී හෝ ද්‍රව්‍යවාදී හෝ නො වෙති. අපි පටිච්චසමුප්පවාදීහු වෙමු.

ද්‍රව්‍යවාදීන් මොළය ආදී ද්‍රව්‍ය ඇතැයි ගන්නේ කෙසේ ද? ඒ ද්‍රව්‍ය අපෙන් තොරව, එනම් මනසින් තොරව පවත්නා බව ඔවුන් දන්නේ කෙසේ ද? එසේ දැනගැනීමට මනස අවශ්‍ය නොවන්නේ ද? ද්‍රව්‍යවාදීන් තම මතය සංගතව පෙන්වාදෙන්නේ නම් ඔවුන් පළමුව කළයුතු වන්නේ මනසින් තොරව ඒ ඇතැයි කියන දෑ එලෙස ඇති බව මනසින් තොරව ම පෙන්වාදීම ය. මනසින් තොරව ද්‍රව්‍ය ඇති බව මනස ආධාරයෙන්, මනසින් තනාගන්නා සංකල්ප ආධාරයෙන් පෙන්වාදෙනතාක් ද්‍රව්‍යවාදීන්ගේ මතය පිලිගතහැකි නො වෙයි.

ඇතැමුන් කියන්නේ ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ පමණක් සත්‍ය බව ය. එනම් ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ පමණක් අප විශ්වාස කළයුතු බව ය. එහෙත් මේ ඉන්ද්‍රිය ගේචර ප්‍රත්‍යක්ෂ යැයි කියන්නා කිසිවක් මනසින් තොරව ගතහැකි නො වෙයි. ඉන්ද්‍රිය ගෝචරවීම යනු ම මනසට ද ගෝචර වීමකි. අනෙක් අතට මෙලෙස ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ පමණක් සත්‍ය ලෙස ගතයුතු යැයි කියන පුහු පණ්ඩිතයන්ට නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය සත්‍යයක් යැයි කිව නොහැකි ය. එයට හේතුව ගුරුත්වාකර්ෂණය ඔවුන් කියන්නා වූ කිසිම ඉන්ද්‍රියකට ගෝචර නො වීම ය.

මේ පුහු පණ්ඩිතයන්ගෙන් එක් අයකුවත් කිසිමදාක ගුරුත්වාකර්ෂණය දැක ඇත් ද? එසේත් නැත්නම් ඒ ස්පර්ශකර ඇත් ද? ඒ ආඝ්‍රාණයකර ඇත් ද? එහි රස බලා ඇත් ද? ගුරුත්වාකර්ෂණය කණෙන් ඇසූ අයෙක් වෙත් ද? නැත. එසේ නම් ගුරුත්වාකර්ෂණය සම්බන්ධයෙන් ගත්කල ඔවුන් මේ සඳහන්කරන ඊනියා ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂය ඇත්තේ කොතැනක ද? ද්‍රව්‍යයේ, එනම් භෞතිකයේ පැවැත්ම ගැන කතාකරන බොහෝ අය උසස් පෙළ පරීක්ෂණයෙන් භෞතික විද්‍යාව සමත් වී නැත. ඔවුන් ගුරුත්වාකර්ෂණය ගැන කුමක් දන්නේ දැයි නිසැකව ම කිවනොහැකි ය. එහෙත් ගුරුත්වාකර්ෂණය නිව්ටන් විද්වතාට පෙර නොතිබූ බවත් අයින්ස්ටයින් විද්වතාගෙන් පසුව නැතිවූ බවත් ඔවුන් නොදන්නා බව නම් නිසැකයෙන් ම කිව හැකි ය.

මේ කසිකබල් ද්‍රව්‍යවාදීන් මනසක් නැතැයි යනුවෙන් කියන්නේ මනස ඉන්ද්‍රිය ගෝචර නොවන නිසා විය හැකි ය. එහෙත් යමක් ඉන්ද්‍රිය ගෝචර නොවූ නිසා ම නො පිළිගන්නේ නම් අඩුම තරමින් සංගතවීම සඳහාවත් ගුරුත්වාකර්ෂණය ද නැති බව පිළිගත යුතු ය. එහෙත් මේ අඥබාලයෝ එසේ නොකරති. ඔවුන්ට සංගත බවක් නැත. බටහිරයන්ගේ මතවාද පසුපස විළි සංගයක් නැතිව යන තැනැත්තාට සංගතයක් තිබිය හැකි ද?

ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂ පමණක් සැබෑ ය, ඒ පමණක් පිළිගත යුතු ය යනුවෙන් තර්ක කරන්නාට අවසානයේ දී අම්මා අප්පාවත් පිළිගැනීමට නො හැකි ය. අම්මා අප්පා ඉන්ද්‍රිය ගෝචරවන්නේ කෙසේ ද? ලෝකයේ වසන කෝටි ගණනක් ගැහැණුන් හා පිරිමින් අතරින් අප දෙදෙනකු පමණක් මව හා පියා ලෙස තෝරාගන්නේ කිනම් ඉන්ද්‍රිය ගෝචර පදනමකින් ද? මෙහි දී ඇතැමුන් කියනු ඇත්තේ ඩී එන් ඒ අණු ඔස්සේ එවැනි නිගමනයකට පැමිණිය හැකි බව ය. එහෙත් ඒ ඉන්ද්‍රිය ගෝචර පදනමක් නො වෙයි. ඒ වක්‍රව අණුක ජීවවිද්‍යාවේ ප්‍රවාද ඔස්සේ ලබාගන්නක් මිස සෘජු ඉන්ද්‍රිය ගෝචර ප්‍රත්‍යක්ෂයක් නො වෙයි.

ඇතැම්විට මේ කසිකබල් ද්‍රව්‍යවාදීන් (මොවුන්ට මා කසිකබල් යැයි කියන්නේ මොවුන්ට යමක් පෙන්වා දුන් පසුත් ඒ නොපිළිගන්නා නිසාත්, එසේ පෙන්වාදීමට එරෙහිව තර්කයක් ගොඩනගාගත නොහැකි නිසාත්, බටහිර මතවාද නොමැති නම් මොවුන්ට ඊනියා ප්‍රභූන් විද්වතුන් ලෙස පැවැත්මක් නොමැති නිසාත් ආදී වශයෙනි) මනසක් නැතැයි

© Prof. Nalin De Silva

කියන්නේ ඒ ඉන්ද්‍රිය ගෝචර නොවීම නිසා පමණක් නොව, බටහිර ඇතැම් පරීක්ෂණවලට අනුව අප සිතන විට මොළයේ ඒ ඒ කොටස් ක්‍රියාකාරී වන නිසා ද යැයි කිවහැකි ය.

බටහිර විද්‍යාඥයෝ මොළය සම්බන්ධයෙන් කරන ඇතැම් පරීක්ෂණවලදී මොළයේ ඒ ඒ කොටස්වලට ඉලෙක්ට්‍රෝඩ සවිකර ඒ ඒ පුද්ගලයාට ඒ ඒ සිතිවිලි ඇතිවන විට ඒ ඉලෙක්ට්‍රෝඩ ඔස්සේ ලැබෙන සංඥා නිරීක්ෂණයකරති. එවැනි නිරීක්ෂණවලින් පැහැදිලි වී ඇත්තේ අපේ සිතිවිලි මොළයේ ඒ ඒ කොටස් හා සම්බන්ධ බව ය. එහෙත් මේ පරීක්ෂණවලින් නිගමනයකළ හැක්කේ කුමක් ද? ප්‍රශ්නය එයයි.

මොළයේ ඒ ඒ කොටස් ඒ ඒ ක්‍රියාකරකම් සමග සම්බන්ධ යැයි බටහිර විද්‍යාඥයන් කීව ද, මොළය යනු එකක් ලෙස ක්‍රියාකරන්නකි. මොළයේ කතාකිරීමට බලපාන්නේ යැයි කියන කොටස ඉවත්කිරීමෙන් පසුවත් ඇතැමුන්ට කතාකිරීමට හැකි වී තිබෙන බව බටහිර විද්‍යාඥයෝම පවසති. මොළයේ කොටසක් ඉවත්කළ ද වෙනත් කොටසක් ඒ ඉවත්කරන ලද කොටසින් කරන ලදැයි කී කාර්යය කරන බවට බටහිර විද්‍යාවේ ම සාක්ෂි ඇත. යම් කාර්යයක් කිරීමේ දී හෝ යමක් සිතීමේ දී හෝ ඉලෙක්ට්‍රෝඩ ඒ අනෙක් කොටස්වලට සවිකර කරන ලද පරීක්ෂණ පිළිබඳ වාර්තා තවමත් බටහිර විද්‍යාවෙන් ලබාගත නො හැකි ය. ඒ කෙසේවෙතත් මොළයේ ඒ ඒ කොටස්වලට ඉලෙක්ට්‍රෝඩ සවිකර ඒ ඒ සිතිවිලි ඇතිවන විට ඒ ඒ ඉලෙක්ට්‍රෝඩවලින් සංඥා ලැබෙන්නේ යැයි නිරීක්ෂණය කළ පමණින් සිතිවිලි යනු මොළයේ වැඩක් පමණක් යැයි නිගමනයකරන්නකුගේ මොළය ගැන නම් ප්‍රශ්න ඇතිවන බව නොකියාම බැරි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva